

# පාරිසරික තුලිතතාව

9 ශ්‍රේණිය

4 වන පාඩම



M.R.M.මාහර


කෑ/දෙහි මියනවිට ක.වි


දැරණියගල

# පරිසරය යනු?

ජීවි සංරචක

අජීවී සංරචක






- ජීවින්ගේ ක්‍රියාකාරකම් වලට පාරිසරික සාධක බලපානු ලැබේ.
- එමෙන්ම ජීවින්ගේ ක්‍රියාකාරකම් ද පරිසරයට බලපානු ලැබේ.
- මෙමගින් යහපත් මෙන්ම අයහපත් බලපෑම් ද සිදුවේ
- මෙම බලපෑම් තුලිතව පවත්වාගැනීම ජීවින්ගේ පැවැත්මට ඉතාමත් වැදගත් වේ.

**ජීවින්ගේ ක්‍රියාකාරකම්** ↔ **පාරිසරික සාධක**

# පාරිසරික තුලිතතාවය යනු?

- සියලුම ශාක සහ සත්ත්ව ප්‍රජාව වෙසෙන පරිසරය ස්වභාවිකව සිදුවන වෙනස්වීම් වලට ප්‍රතික්‍රියා දක්වමින් පරිසරයේ ගුණාංග ආරක්ෂා කරමින් පවත්වාගෙන යාමය.



# මිනිසා පරිසරය සමඟ සුසන්යෝගීව දිවි ගෙවන අයුරු........





# පාරිසරික අසංතුලනයට හේතු හා එහි බලපෑම



1. වනාන්තර විනාශ කිරීම

ජල මුලාශ්‍ර සිඳී යාම.

නියඟ ඇතිවීම.

පරිසර උණුසුම ඉහළ යාම.

වන ජීවින් විනාශ වී යාම.

## 02. පොසිල ඉන්ධන දහනය

ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම.

වායු දූෂණය.

දේශගුණ වෙනස්වීම් ඇතිවීම.





# 03.කෘෂි රසායන භාවිතය

ජලය අපවිත්‍ර වීම.

පස නිසරු වීම.

ජලජ ජීවින් මිය යාම.



# 04. යුධ අවි අත්හදා බැලීම



වායු දූෂණය.

සාගර ජීවීන් විනාශ වීම.

සාගරය තුළ භූමි කම්පා ඇතිවීම.

# 05. කැළිකසල අක්‍රමවත් ලෙස  බැහැර කිරීම




පාරිසරික සෞන්දර්ය විනාශ වීම.

සෞඛ්‍ය ගැටළු ඇතිවීම.



# පාරිසරික තුලිතතාවය බිඳ වැටුණු අවස්ථා......

කුණු කඳු නාය යාමක්





# පිළිතුරු සපයන්න

01. පාරිසරික අසන්තුලනයට බලපානු ලබන හේතුන් දක්වන්න.

02. පාරිසරික අසන්තුලනය නිසා පරිසරයට සිදුවන හානි නම් කරන්න.

03. පාරිසරික තුලිතතාවය බිඳ වැටුණු අවස්ථා පිළිබඳ පහත මාතෘකා යටතේ පෙළගස්වන්න

- රට
- දිනය
- සිදුවීම
- බලපෑම.

# පාරිසරික ආචාර ධර්ම

පරිසරය යහපත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන සාරවත් යහපුරුදු පරිසර ආචාර ධර්ම වේ.

## ආචාර ධර්ම

- පුද්ගල ජීවිතය සමඟ බැඳී පවතී.
- තම කැමැත්තෙන් පිළිපදී.
- නීති-රීති, චාරිත්‍ර -වාරිත්‍ර ,සම්මතයන්ට අනුගත වී ඇත.

# පරිසර ආචාර ධර්ම අවශ්‍ය වන්නේ ඇයි?

- පරිසරය ආරක්ෂාවට
- පරිසරය පිලිබඳ හැඟීමක් මිනිසා තුළ ඇති කරලීමට
- අධික ලෙස සම්පත් පරිභෝජනය සීමා කිරීමට

# අතීතයේ මිනිසා....

01. පරිසරයට බැතිමත්ව, දේවත්වයෙන් සලකණු ලැබීය.

නිදසුන්: හිරු දේවියා - ආටෙන්

ගස්වැල්වලට අධිපති - ඔරිසිස්

සුළි සුළඟට අධිපති - සෙත්

02. පරිසරය ආරක්ෂා කරන ලදී.

නිදසුන්: රතු ඉන්දියානු නායක- සියටෙල්

03. පරිසරය පවතින ලෙසම ප්‍රයෝජනයට ගත්හ.

නිදසුන් : ආදිවාසී ජනයා



04. පරිසරය සමඟ සහයෝගයෙන් කටයුතු කළහ.

## වර්තමාන මිනිසා......

01.පරිසරය වෙනස් කරමින් ප්‍රයෝජනයට ගනී.

නිදසුන්: වනාන්තර එළිකර සංවර්ධන කටයුතු සිදුකිරීම.

***<u>මේ නිසා පාරිසරික ආචාර ධර්ම පරිසරයේ පැවැත්මට වැදගත් වේ.</u>***

## බුදුදහම

පළතුරු,මල් උයන් වතු රෝපණය කරන්නන්, ඒ දඬු පාලම් තනවන්නන්,ළිංපොකුණු කරවන්නන්,වාසස්ථාන කරවා දෙන්නන් යන අයට දිවා රෑ සැම දිනම පින් වැඩෙන අතර ඔවුහු සුගතියට පත් වෙති.

## පරිසරය පිළිබඳ ආගමික සංකල්ප

## බයිබලය

පොළොව පවතින තෙක් වැපිරීම් හා කැපීම ද ශීත හා උෂ්ණුසුම ද සිසිර හා ගිම්හානය ද දවල හා රාත්‍රිය ද නොකඩවා පවතිනු ඇත.



# සියැටල්.....


"_ සියලුම
වෘක්ෂ ලතාවෝ
කපා දැමූ පසු
සියලුම ගංගාවෝ
සිඳී ගිය පසු
අන්තිම මාලුවාද
අල්ලා ගත් පසු
මිනිසා තේරුම් ගනීවි
මුදල්
ආහාරයට ගත
නොහැකි බව..."
- සියැටල් -



ඔබේ නහර වල රුධිරය
සිරුරෙන් ඉවතට ගිය විට
ඔබේ ඇටකටු නිසැකවම පොළොවට පස් වේ
මන්ද,
රුධිරය නොමැතිව ඔබට
ජීවත් විය නොහැකි නිසාය
ඔබ මහපොළොව
විනාශ කරන විට
සියල්ල අවසානයේ විනාශ වන්නේ
ඔබම බව මතක තබාගන්න
—— සියැටල් ——
SAKWALA

# තිරසාර සංවර්ධනය

වර්තමාන අවශ්‍යතා සපුරා ගනිමින් අනාගත පරපුරට ද ස්වකීය අවශ්‍යතා ඉටුකර ගැනීමට ඇති අයිතිය තහවුරු කරන පරිසරයක් ගොඩනගමින් සිදු කෙරෙන සංවර්ධනය තිරසාර සංවර්ධනය වේ.


මෙහිදී පරිසරය ආරක්ෂා කරමින් සංවර්ධන කටයුතු සිදු කෙරේ.

# තිරසාර සංවර්ධනය අවස්ථා......









# පරිසර තුලිතතාව ආරක්ෂාවට ගෙන ඇති ක්‍රියාමාර්ග


## ජාතික මට්ටමින්

- වෙරළ සංරක්ෂණය
- වන ජීවින් හා වන සංරක්ෂණය
- ඉඩම් භාවිතය සැලසුම් කිරීම
- පරිසර අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාවට නැංවීම

## ජාත්‍යන්තර මට්ටමින්

- රැම්සාර් සම්මුතිය (තෙත්බිම සංරක්ෂණයට )
- මොන්ට්‍රියල් සම්මුතිය (ඕසෝන් ස්තරය ආරක්ෂා කිරීමට )
- වියානා සම්මුතිය
- කියෝතෝ සම්මුතිය
- බාසල් සම්මුතිය
- පැරිස් සම්මුතිය

# රැම්සාර් සම්මුතිය




**තෙත්බිම් පිළිබඳ**
**රැම්සා සම්මුතිය**
**(The Ramsar Convention on Wet Lands)**

කැස්පියන් මුහුදේ දකුණු ඉවුරේ පිහිටි, ඉරානයේ රැම්සා නගරයේ දී 1971 පෙබරවාරි මස 02 දින අන්තර්ජාතික තෙත්බිම් සම්මුතිය සම්මත කරන ලදි. තෙත්බිම් සම්මුතිය ලෙස නම් කර තිබුණ ද වඩාත් ජනප්‍රිය ව ඇත්තේ, රැම්සා සම්මුතිය ලෙසය.

තෙත්බිම් හා එහි සම්පත් සංරක්ෂණය හා බුද්ධිමත් ලෙස පරිහරණය කිරීම සඳහා ගත යුතු ජාතික ක්‍රියාකාරකම් හා අන්තර්ජාතික සහයෝගීතාව දැක්වෙන එකඟතා ගිවිසුමක් ලෙස තෙත්බිම් සම්මුතිය දැක්විය හැකිය.




- සම්මුතිය සම්මත වූ දිනය :- 1971 පෙබරවාරි 02
- බලාත්මක වූ දිනය :-1975 දෙසැම්බර් 21
- ලංකාව තුළ අනුමත වූ දිනය :- 1990.06.15
- ලංකාව තුළ බලාත්මක වූ දිනය :- 1990.10.15
- ජාතික කේන්ද්‍රීය ස්ථානය :- වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව




**අප රටේ පිහිටි රැම්සා තෙත්බිම්**

1. කුමන තෙත්බිම
2. බූන්දල තෙත්බිම
3. මාදුගඟ තෙත්බිම
4. ආනවිලුන්දාව තෙත්බිම
5. වංකලායි කලපුව
6. විල්පත්තුවේ ඇති තෙත්බිම

# පරිසර ආරක්ෂාවට ලොව රටවල්වල එකඟතත්වයෙන් ගෙන ඇති පියවර

- පැරිස් සම්මුතිය : හරිතාගාර වායුන් මඟින් ඇතිවන වායු දූෂණය අවම කිරීමට
- වියානා සම්මුතිය ඕසොන් ස්ථරය සුරැකීමට
- මොන්ට්‍රියල් සම්මුතිය ඕසොන් ස්ථරය සුරැකීමට
- කියෝතෝ සම්මුතිය: ලෝක උෂ්ණත්වය ඉහළ යාම පාලනයට
- බාසල් සම්මුතිය විෂ සහිත රසායන ද්‍රව්‍ය බැහැර කිරීම පාලනයට

Ramsar

CONVENTION ON WETLANDS

(Ramsar, Iran, 1971)

මධ්‍යම පරිසර අධිකාරිය

மத்திய சுற்றாடல் அதிகாரசபை

Central Environmental Authority



# පිළිතුරු සපයන්න

- 01. පරිසර තුලිතතාව බිඳ වැටීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල අවමයට ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද ?


මහ පොළොව, ගහ කොළ
මිනිසාට අයිති නැත....
සියල්ල අනාගතයටද
ඉතිරි කර
තමන්ගේ අඩි සලකුණ පමණක්
මහ පොළොවේ
ඉතිරි කර යන්න
සියැටල්
SAKWALA OFFICIAL